# මාසික මහ සභා රැස්වීම - 2022/01/11 දින
# අලව්ව ප්‍රාදේශීය සභාව

2022/01/11 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 46 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු සභාපතිනී - පද්මා වැත්තැව මැතිණිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - එච්.ඒ.සී.නිලූ ගුණරත්න මැතිණිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩබ්.පී.ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.ඉසුරු චතුරංග එදිරිවීර මැත්තුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු සභාපතිනී පද්මා වැත්තැව මැතිණිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 46 වන මහ සභා රැස්වීමට සපැමිණි ඔබ සියලු දෙනා ඉතාම ගෞරවයෙන් පිළිගනු ලබනවා. විශේෂයෙන්ම අද 2022 වර්ෂයේ ආරම්භක රැස්වීම පැවැත්වෙන්නේ සියළු දෙනාටම සුභ අළුත් අවුරුද්දක් වේවා යි පතමින්. අද දින රැස්වීම සඳහා පැමිණි අපේ සියළුම මන්ත්‍රිතුමන්ලා සහ මන්ත්‍රිතුමියන්ලාත් පැමිණ සිටින මාධ්‍යවේදී මහත්වරුත් , අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනා ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා.

## 01. 2021/12/14 දින මහ සභා වාර්තාව ස්ථිර කිරිම.

**ගරු සභාපතිනී පද්මා වැත්තැව මැතිණිය**

2021.12.14 දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරිමට තීරණයක් ගැනීමට පෙර වාර්තාවේ පහත සඳහන් අඩුපාඩු සංශෝධන ඇතුලත් විය යුතු බව සඳහන් කරනවා .

**මේ අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාරද සිරිවර්ධන මැතිතුමා සභාවේ න්‍යාය පත්‍රයට පටහැනිව අදහස් පල කරන්නට විය.**

**ගරු සභාපතිනී පද්මා වැත්තැව මැතිණිය**

ගරු මන්ත්‍රීතුමනි ඔබ තුමා සභා රීති වලට පටහැනිවයි කටයුතු කරන්නේ . වෙනත් කරුණු යටතේ අදහස් පල කරන්න අවස්ථාව ලබාදෙනවා. න්‍යාය පත්‍රය අනුව සභා වාර්තාව සම්මත කිරීමයි සිදුකළ යුත්තේ . ඒ සදහා අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

මෙහිදී ගරු උප සභාපති ධර්මරත්න හේරත් මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාරද සිරිවර්ධන , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමින්ද සමන්කුමාර, , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චාමින්ද ප්‍රියන්ත අතුකෝරළ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.කරුණාරත්න,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ස්වර්ණකාන්ති රාජපක්ෂ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නලින් ඩයස් රාජපක්ෂ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් කුමාරසිංහ , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාමිණී සෙනරත් ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නිලූ ගුණරත්න, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ජයලත් යන මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා කලහකාරී ලෙස මන්ත්‍රීවරුන්ගේ මේස පෙරලමින් ඉදිරියට පැමිණෙමින් ගරු සභාපතිතුමියට සභා කටයුතු පවත්වාගෙන යාමට බාධා පමුණුවමින් කලහකාරී ලෙස හැසිරුණහ.

මෙහිදී ගරු සභාපතිතුමිය විසින් කලහකාරී ලෙස හැසිරුණු මන්ත්‍රීවරුන් නම් කරමින් විනය විරෝධී ලෙස නොහැසිරෙන ලෙස දැනුම් දුන්නද ඔවුන් වෙත ලබා දි තිබූ න්‍යාය පත්‍ර හා වාර්තා ගිණි තබමින් සෝෂාකාරී අයුරින් හැසිරුණි. කෙසේ වුවත් බාධා කිරීම් මධ්‍යයේ පහත සඳහන් සංශෝධන සභා වාර්තාවට ඇතුලත් විය යුතු බව ගරු සභාපතිතුමිය දැනුම් දෙන ලදි.

**I. සභා වාර්තාවේ 47 සහ 48 පිටුවල ඇතුලත් 05.31 යෝජනාව පහත පරිදි සංශෝධනය විය යුතුය.**

(05-31)<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/45 –31 දරණ යෝජනාව</u>

මිරිහෙලිය සභාව සතු ඉඩමේ අනතුරුදායක ලෙස පිහිටි කොස්ගස් 03 ක් වෙන්දේසි කිරීමට මිල ගණන් කැඳවුව ද අවම තක්සේරුවට වඩා අඩු තක්සේරුවකට ඉල්ලුම් කර ඇති බැවින් මේවා ඉවත්කිරීමට නොහැකි විය. ඒ අනුව 2021.12.07 වන දින පහත සඳහන් පරිදි මිළ ගණන් ඉදිරිපත් වී ඇත. තීරණයක් ලබාගැනීමට ඉදිරිපත් කරමි.

| අනු අංකය | ගස් වර්ගය | සංශෝධිත තක්සේරු වටිනාකම | ජේ.අයි. අනුර කුමාර | ජේ.ඊ.ඩබ්. වංශනාථ | බී.එම්. නිමල් බාලසූරිය |
|---|---|---|---|---|---|
| 01 | කොස් ගස් 1 | (රු.) 65625.00 | (රු.) 50000.00 | (රු.) 40000.00 | (රු.) 40500.00 |
| 02 | කොස් ගස් 2 | (රු.) 57900.00 | (රු.) 40000.00 | (රු.) 30000.00 | (රු.) 30500.00 |
| 03 | කොස් ගස් 3 | (රු.) 34700.00 | (රු.) 35000.00 | (රු.) 25000.00 | (රු.) 24600.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, දැනට ඉදිරිපත් වී ඇති වැඩිම මිල ගණන් යටතේ මෙම ගස් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා. තවදුරටත් මෙම ගස් පැවතියහොත් ජීවිත හානි පවා සිදුවිය හැකි නිසා හැකි ඉක්මනින් එම කටයුතු සිදු කිරීම සුදුසු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව මිරිහෙලිය සභා සතු ඉඩමේ අනතුරුදායක ලෙස පිහිටි කොස්ගස් 03 සඳහා ඉදිරිපත් වී ඇති මිල ගණන් අතරින් වැඩිම මිල ගණන ඉදිරිපත් කර ඇති ජේ.අයි. අනුර කුමාර මහතා වෙත ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**II. සභා වාර්තාවේ 1 වන පිටුවේ ඇතුලත් පිළිගැනීමේ කතාවෙහි මුද්‍රණ දෝශයකින් "ගාමිණී වැත්තැව මැතිතුමා" යන්න ඇතුලත් වී ඇති අතර එය "ගාමිණී සෙනරත් මැතිතුමා" යනුවෙන් සංශෝධනය විය යුතුය.**

**III. සභා වාර්තාවේ 37 සහ 38 පිටුවල සඳහන් 05.14 සහ 05.16 යෝජනාවල ඇතුලත් ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනියගේ ප්‍රකාශවල "ගරු සභාපතිතුමියනි" ලෙස අතපසුවීමකින් සටහන් වී ඇති අතර එම ප්‍රකාශවලින් එම ආමන්ත්‍රණය ඉවත් විය යුතුය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි 2021.12.14 දින පැවති VI වන සැසිවාරයේ 46 වන මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමිය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන වලට යටත්ව ස්ථිර කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි , එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපතිනී පද්මා වැත්තැව මැතිණිය**
එහෙනම් ඉහත සංශෝධන වලට යටත්ව වාර්තාව සභා සම්මත කරනවා.

ඒ අනුව 2021.12.14 දින පැවති VI වන සැසිවාරයේ 46 වන මහ සභා රැස්වීම් වාර්තාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 11 දෙනෙක් සභා කටයුතු වලට අනුගත නොවී කටයුතු කරද්දී මන්ත්‍රීවරු 14 දෙනෙකුගේ බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

මේ අවස්ථාවෙදි කලහකාරී ලෙස හැසිරුණු පිරිස ගරු සභාපතිතුමියගේ මේසය බිම දමමින් එහි තිබූ ලිපිගොනු ගිණි තැබීමට තැත් කරමින් කටයුතු කළ අතර සභාපතිතුමිය අත රැදි න්‍යාය පත්‍රය උදුරා ගිනිතබන ලදි.

**ගරු සභාපතිතිනී පද්මා වැත්තැව මැතිණිය**
ගරු මන්ත්‍රීවරුනි මේ අවස්ථාවේ සභාවේ කටයුතු පැයකට කල් තබනවා.
ඒ අනුව පෙ.ව.10.30 ට පමණ සභාවේ කටයුතු පැයක කාලයකට කල් තබන ලදී.

අනතුරුව කල්තබන ලද මහ සභාවේ කටයුතු නැවත ආරම්භ කරන ලදි.

මෙහිදී ද පෙර සඳහන් ගරු මන්ත්‍රීවරුන් කළහකාරී ලෙස හැසුරුණු අතර එම බාධා කිරීම් මැද සභාපතිතුමිය විසින් න්‍යාය පත්‍රයට අනුව කරුණු සභාවට ඉදිරිපත් කරන ලදි.

**02.<u>සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත</u>**

**<u>03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම</u>.**

**ගරු සභාපතිනී පද්මා වැත්තැව මැතිණිය**

**<u>03.1 නැබඩවතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ රාජ්‍ය නිලධාරීන් සඳහා කාර්යාල සංකීර්ණයක් සහ රැස්වීම් ශාලාවක් ඉදි කිරීම.</u>**

2021/10/12 දින මහ සභා රැස්වීමේ සම්මත වූ යෝජනාවකට අනුව අප ප්‍රාදේශීය සභාව විසින් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අංක අල/ප්‍රාස/7/12/ඉඩම්පොදු හා 2021.11.22 දිනැති ලිපිය මගින් නැබඩවතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ රජයට අයත් ඉඩමේ පැවති ග්‍රාම නිලධාරී කාර්යාලයේ ගොඩනැගිලි හා අනෙකුත් ඉදිකිරීම් උපයෝගී කර ගනිමින් බෝයවලාන ප්‍රදේශය සඳහා නව පොලිස් ස්ථානයක් ස්ථාපනය කර ඇති බවත් දැනට ග්‍රාම නිලධාරී ඇතුළු ග්‍රාමීයව සේවය කරන රාජ්‍ය නිලධාරීන් සඳහා කාර්යාල පහසුකම් නොමැති බැවින් එම ස්ථානයේ වෙන් කරන ලද වෙනත් කොටසක කාර්යාලයක් නැවත ස්ථාපිත කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙසත් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන්,

නිල සෙවණ කාර්යාල ඉදිකිරීමට අදාලව 2022 වර්ෂයේ අමාත්‍යාංශය වෙත ලැබෙන ප්‍රතිපාදන මත මෙම ඉල්ලීම පිළිබඳව සලකා බැලීමට කටයුතු කරනු ලබන බවත් නිල සෙවණ ඉදි කිරීමට අදාල නව යෝජනා සහ ප්‍රතිපාදන ඉල්ලීම් පිළිබඳ ප්‍රමුඛතාගත කරනුයේ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ දත්ත පද්ධතිය තුලින් වන අතර නමුත් මීට අදාල තොරතුරු නිල සෙවණ දත්ත පද්ධතියට ඇතුලත් කර නොමැති බව නිරීක්ෂණය වන බැවින් එම තොරතුරු නව නිල සෙවණ කාර්යාල ඉදි කිරීමට අදාල වන දත්ත පද්ධතිය තුල යාවත්කාලීන කරන මෙන් දන්වමින් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවන ලද ලිපිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිවරුන් දැනුවත් කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිණිය**

**<u>03.2 වරිපණම් ගෙවීම සම්බන්ධයෙන් කෙරෙන අභියාචනයයි.</u>**

නො.180/1, දිවුල්ගහමුලවත්ත, උරුලැමුල්ල, අලව්ව ලිපිනයේ පදිංචි චන්ද්‍රිකා මහත්මිය විසින් යොමු කර ඇති ලිපියට අනුව තමා ඉහත ලිපිනයේ අවුරුදු 35 ක කාලයක් ජීවත් වන නමුත් මීට පෙර කිසිම දිනක වරිපණම් මුදල් ගෙවා නොමැති බවත් කිසිදු රැකියාවක් නොමැතිව ඉතාම අපහසුවෙන් ජීවත් වන තමා හට මෙම වරිපණම් මුදල් ගෙවිය නොහැකි බව මීට ඉහතදීත් දන්වන ලද බවත් ඒ අනුව තමා හට සාධාරණයක් ඉටු කර දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇති අතර මෙම ලිපිය සඳහන් තැනැත්තිය අඩු ආදායම්ලාභී තැනැත්තියක් බව ක්ෂේත්‍ර පරික්ෂාවේදී පෙනී ගිය බවත් ඇයව වරිපණම් බද්දෙන් නිදහස් කිරීම සුදුසු බවටත් ආදායම් පරීක්ෂක විසින් වාර්තා කර ඇති අතර මෙම තැනැත්තිය අඩු ආදායම්ලාභිනියක් බව ග්‍රාම නිලධාරීතුමා විසින්ද සනාථ කර ඇත.ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 135 (ඉ) වගන්තියේ සඳහන් නියමයන්ට අනුව වරිපනම් බද්දෙන් නිදහස් කිරීම සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීමට.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මැතිතුමා**

නො.180/1, දිවුල්ගහමුලවත්ත, උරුලෑමුල්ල, අලව්ව ලිපිනයේ පදිංචි චන්ද්‍රිකා මහත්මිය අඩු ආදායම්ලාභිනියක බැවින් 1987 අංක 15දරණ ප්‍රාදේශීය සභා පනතේ 135 (ඉ) වගන්තියේ සදහන් නියමයන්ට අනුව වරිපනම් බද්දෙන් නිදහස් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව නො.180/1, දිවුල්ගහමුලවත්ත, උරුලෑමුල්ල, අලව්ව ලිපිනයේ පදිංචි චන්ද්‍රිකා මහත්මිය අඩු ආදායම්ලාභිනියක බැවින් 1987 අංක 15දරණ ප්‍රාදේශීය සභා පනතේ 135 (ඉ) වගන්තියේ සදහන් නියමයන්ට අනුව වරිපනම් බද්දෙන් නිදහස් කිරීම සුදුසු බවට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 11 දෙනෙක් සභා කටයුතු වලට අනුගත නොවී කටයුතු කරද්දී මන්ත්‍රීවරු 14 දෙනෙකුගේ බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිණිය**

**<u>03.3 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පනතේ 2(ආ) 1 වගන්තිය යටතේ තෙත් බිම් ප්‍රකාශයට පත් කිරීම - වයඹ පළාත.</u>**

ගරු වෙරළ සංරක්ෂණ සහ පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා වෙත මෙම සංස්ථා පනතෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු ඉඩම් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව වයඹ පළාතෙහි පිහිටි පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු බිම් සංස්ථා පනතේ 2(ආ) 1 වගන්තිය යටතේ 2021.11.25 දිනැති හා අංක 2255/46 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර එලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශයන්හි පහත්බිම් ආශ්‍රිත සංවර්ධන කටයුතු වලදී ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසි හා සීමාවන් අනුව කටයුතු කල යුතු බවත් එකී ප්‍රදේශ තුල සිදු කරනු ලබන අනවසර ගොඩකිරීම් හා සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන සැලසුම් සඳහා අනුමැතිය ලබා නොදෙන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉඩම් හා අලෙවි) විසින් යොමු කර ඇති ලිපිය. (මෙම ගැසට් පත්‍රයේ පිටපත් ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇත.) මෙය ගරු මන්ත්‍රීවරුන්ගේ දැනගැනිම සඳහා ඉදිරිපත් කරනවා

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිණිය**

**<u>03.4 වීථි රේඛා සහතිකයක් ලබා ගැනීම.</u>**

සීමා සහිත ඉදිකඩහේන සණස සමිතියේ ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා නිමල් ආනන්දතිලක මහතා විසින් පර්. 04ක බිම් ප්‍රමාණයක් පරිත්‍යාග කර ඇති බවත්, මෙම සමිතිය සඳහා කාර්යාලය සෑදීමට සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා වීථි රේඛා සහතිකයක් ඉදිරිපත් කල යුතු බැවින් විශේෂ අනුමැතියක් යටතේ වීථි රේඛා සහතිකයක් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලීමක් කරමින් නුංගමුව පහළ, නුංගමුව, යටිගල්ඔළුව, සීමා සහිත ඉදිකඩහේන සණස සමිතියේ සභාපතිතුමන් විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ ප්‍රියන්ත සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ඉහත සමිතිශාලාව ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 11 දෙනෙක් සභා කටයුතු වලට අනුගත නොවී කටයුතු කරද්දී මන්ත්‍රීවරු 14 දෙනෙකුගේ බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**03.5 සිද්ධස්ථානයට සුසාන භූමියක් ලබා ගැනීම.**

අලව්ව සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ පවුල් 75 ක පමණ සැදැහැවත් ගිහි ජනතාවගේ භූමදාන කටයුතු කතෝලික අනන්‍යතාවයක් ඇතිව සිදු කිරීමට කතෝලික ජනතාවටම වෙන් වූ සුසාන භූමියක් නොමැතිකම නිසා දිගු කාලීනව පීඩා විඳින බවත් මේ පිළිබඳව සලකා බලා දේවස්ථානයටම වෙන් වූ සුසාන භූමියක් පවත්වාගෙන යාමට දේවස්ථානය ඉදිරිපිට පිහිටි මහා මාර්ගයට අයත් භූමිය හැර වර්ෂ 1990 සිදු කරන ලද මැනීම් කටයුතු වලට අනුව අක 332 යටතේ පර්චස් 19.5 අයත් ලොට් අංක 1 සහ 2 යන ඉතිරි භූමි භාගය යොදා ගැනීම පිළිබඳ දායකයන්ගේ ප්‍රබල ඉල්ලීමක් ඇති බවත් එම නිසා අලව්ව සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ සිද්ධස්ථානයට අයත් එම භූමි භාගය කතෝලික දේවස්ථානයේ සුසාන භූමිය බවට පත් කර ගැනීමට අවසර ලබා දෙන මෙන් ඉල්ලීමක් කරමින් ගරු ජෙරල්ඩ් වී. ප්‍රනාන්දු පියතුමා විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

අලව්ව සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ කතෝලික සුසාන භූමියකට අවසර ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය අනෝමා දිල්රුක්ෂි රණවීර මහත්මිය**

ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 11 දෙනෙක් සහා කටයුතු වලට අනුගත නොවී කටයුතු කරද්දී මන්ත්‍රීවරු 14 දෙනෙකුගේ බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**03.6 කපුවරල පොරමඩල මාර්ගය සංවර්ධනය කිරීමේදී සිදුවූ අසාධාරණයක් සම්බන්ධයෙන්**

අලව්ව ඉහල වළකුඹුර අලුත්වත්ත ඩබ්.ඒ ජයසිංහ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් කපුවරල පොරමඩල මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ දැනට ඇති පාර මධ්‍ය රේඛාවේ සිට දෙපසින්ම අවශ්‍ය වන භූමි ප්‍රමාණය වෙන්කරගැනීම සිදුවිය යුත්තක් වුවත් අවශ්‍ය භූමි ප්‍රමාණය තම ඉඩමෙන් හා නිමල් වීරසේකර යන අයගෙන් පමණක් අයත් වනසේ පුළුල් කිරීමක් සිදුවන බවත් අනික් පස ඉඩම් හිමිකරු විසින් අවශ්‍ය බිම් ප්‍රමාණය ලබාදීමට අකමැත්ත පලකිරීම නිසා ගැටළුවක් පැන නැගී ඇති බවටත් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් කාර්මික නිලධාරී විසින් පරීක්ෂා කර බලා එක් අවස්ථාවක ඉහත ලිපිය ඉදිරිපත් කර ඇති අයගේ ඉඩමෙන් පමණක් ලබාදී ගැටළුව විසඳීමට කටයුතු කළත් නැවතත් එම මාර්ගය සඳහා පලල ප්‍රමාණවත් නොවන බැවින් අනික් පාර්ශවයෙන්ද  බිම් ප්‍රමාණය ලබාගත යුතුව ඇත. එම කොටසේ සභාවේ අනුමැතියකින් තොරව ඉදිකරන ලද තාප්පයක් පවතින බැවින් අදාළ ඉඩ ප්‍රමාණය ලබා ගැනීමට එම තාප්පය කඩා ඉවත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරී වාර්තාවට අනුව අනවසර ඉදිකිරීම් ඉවත් කර මාර්ගය දෙපස ඉඩම් හිමියන්ගෙන්  අදාළ බිම් ප්‍රමාණය ලබාගැනීම සම්බන්ධයෙන් තීරණයක් ලබාගැනීමට ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔබ තුමිය ඉදිරිපත් කළ කාර්ය ඉටුකිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 11 දෙනෙක් සහා කටයුතු වලට අනුගත නොවී කටයුතු කරද්දී මන්ත්‍රීවරු 14 දෙනෙකුගේ බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**04.** <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත</u>

**05.** <u>යථා පරිදි කල්දී ඇති යෝජනා.</u>

**(05-1)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/46 - 01 දරණ යෝජනාව</u>

පහත නම් සඳහන් අය දෛනික පදනම මත අප සභාවේ සේවය කරන අතර ඔවුන්ගේ ගිවිසුම් කාලය 2022 මාර්තු මස අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය ගිවිසුම් කාලය අවසන් වන දින සිට මාස 06 ක කාලයකට දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| | නම | තනතුර | අවසන් දිනය |
|---|---|---|---|
| 1. | නිමාලි ශෝභා තිලකරත්න | පුස්තකාල සහායක | 2022.03.16 |
| 2. | ඩබ්.එම්.ඒ.පී.කේ. ජයසූරිය | රියදුරු | 2022.03.04 |
| 3. | ඒ.සී. අජිත් විජේකුමාර | ක්ෂේත්‍ර කම්කරු | 2022.03.01 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි ඔබතුමිය ඉදිරිපත් කළ කාර්ය ඉටුකිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 11 දෙනෙක් සභා කටයුතු වලට අනුගත නොවී කටයුතු කරද්දී මන්ත්‍රීවරු 14 දෙනෙකුගේ බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**(05-2)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/46 - 02 දරණ යෝජනාව</u>

කුරුණෑගල පාර දකුණ තක්සේරු ලේඛනයේ නම සඳහන් ටී.ඩී.එස්. ගුණසේකර යන අයට අයිති වරිපණම් අංක 24 දරණ දේපල දැනට කොටස් 05 කට කඩා වෙන් කර ඇති අතර මෙම ඉඩමේ කොටස් දෙකක් මිලදී ගත් ගැනුම්කරුවන් දෙදෙනෙකු විසින් එම දේපලට අදාලව නව වරිපණම් අංක ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීමට අනුව පහත සඳහන් පරිදි තාවකාලික වරිපණම් අංක ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

| කැබලි අංකය | තාවකාලික වරිපණම් අංකය | නීතිඥ මහතාගේ වාර්තාවේ සඳහන් ආකාරයට විකුණුම්කරුගේ නම | නීතිඥ මහතාගේ වාර්තාවේ සඳහන් ආකාරයට වර්තමාන ගැනුම්කරුගේ නම | ඔප්පුවේ සඳහන් ආකාරයට වර්තමාන හිමිකරුගේ නම |
|---|---|---|---|---|
| 05 | 24 | අසිත ගුණසේකර | කේ. ටී. ජිනිඳු ඕවින්ද ප්‍රේමරත්න | කේ. ටී. ජිනිඳු ඕවින්ද ප්‍රේමරත්න |
| 03 | 24D | අසිත ගුණසේකර | බී.ඒ. සජිත් නිශාන් වික්‍රමසිංහ | බී.ඒ. සජිත් නිශාන් වික්‍රමසිංහ |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි තාවකාලික වරිපනම් අංක ලබාදීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත සෝමසිරි බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 11 දෙනෙක් සභා කටයුතු වලට අනුගත නොවී කටයුතු කරද්දී මන්ත්‍රීවරු 14 දෙනෙකුගේ බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**(05-3)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/46 - 03 දරණ යෝජනාව</u>**
මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කාපට් කරනු ලබන බුරුසේගොඩ කඳයාය මාර්ගයේ අනතුරුදායකව හා බාධකව පවතින තල් ගස, තේක්ක ගස හා ලුණුමිදෙල්ල ගස තාක්ෂණ නිලධාරීතුමා විසින් පරීක්ෂා කර බලා ඒවා ඉවත් කිරීම සුදුසු බවට වාර්තා කර ඇති අතර ඒ සඳහා තීරණයක් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඔබතුමිය ඉදිරිපත් කළ කාර්ය ඉටුකිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 11 දෙනෙක් සභා කටයුතු වලට අනුගත නොවී කටයුතු කරද්දී මන්ත්‍රීවරු 14 දෙනෙකුගේ බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**ගරු සභාපතිතුමිය විසින් න්‍යාය පත්‍රයේ ඊලගට නියමිත යෝජනාව ඉදිරිපත් කිරීමට සැරසෙත්ම නැවත වරක් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි නාරද සිරිවර්ධන මැතිතුමා විසින් න්‍යාය පත්‍රය උදුරා ඉරා ගිනි තබන ලදි .** අනෙකුත් කළහකාරී ලෙස හැසිරුණු මන්ත්‍රීවරුන්ද සෝෂාකාරී ලෙස හැසිරෙමින් සභාපතිතුමියට බාධා කරමින් හැසිරුණි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි අපි මහජන නියෝජිතයින් ලෙස මාසයකට සැරයක් මේ ගරු සභාව නියෝජනය කරන්නේ බල ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න ගැටළු මේ සභාවට ඉදිරිපත් කරල ඔවුන් වෙනුවෙන් සේවයක් කිරීමට.එහෙත් මේ පවතින තත්ත්වය යටතේ තව දුරටත් මේ සභාව පවත්වාගෙන යාම අපහසු බැවින් වෙනත් දිනයක මේ සභාව පවත්වන ලෙස මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු සභාපතිනී පද්මා වැත්තෑව මැතිණිය**
ගරු මන්ත්‍රිවරුනි එසේනම් මේ සභාව වෙනත් දිනයක පැවැත්වීමට කල් තබනවා. එය ඔබලා වෙත නියමිත පරිදි දැනුම් දෙන්නම්.

**ඒ අනුව සභාවේ ඉතිරි කටයුතු වෙනත් දිනයක පැවැත්වීමට කල් තබන ලදි.**

.

2022/01/11
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.